# "දිදුලන මිණිමුතු" ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර හා මෙල්බර්න් නුවර සංචාරය






කැන්බරා නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධූර තැන්පත් සෝමසුන්දරම් ස්කන්ධ කුමාර මැතිතුමන් සමග






**ගායන අංශයෙන් පසුගිය දිනෙක , දිදුලන මිණිමුතු, වැඩසටහනේ කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශයන් හි පළමු වන ස්ථානය ජයග්‍රහණය කළ දෙදෙනාට ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර හා මෙල්බර්න් නුවර දැක බලාගන්නට මෙරට මුතුහර ළමා සමාජය මගින් ආරාධනා ලැබූ දවසක්**

ජාතික රූපවාහිනී නාලිකාවෙන් ,මුතුහර ළමා සමාජය මගින් සංවිධානය කරනු ලැබූ දිදුලන මිණිමුතු, නම් දු දරුවන්ගේ උපරිම වූ හැකියාවන් ඉදිරිපත් කරන දීපව්‍යාප්ත වූ වැඩසටහනක් වන අතර හෙට දවස දීප්තිමත් කරන ළමුනට වැඩ දායක වූ, මුතුහර, මුතු දිදුලන තවත් කාර්‍යභාරයක් ද වෙනවා.

ගායන අංශයෙන් පසුගිය දිනෙක , දිදුලන මිණිමුතු, වැඩසටහනේ කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශයන් හි පළමු වන ස්ථානය ජයග්‍රහණය කළ දෙදෙනාට ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර හා මෙල්බර්න් නුවර දැක බලාගන්නට මෙරට මුතුහර ළමා සමාජය මගින් ආරාධනාවක් හා ඉඩප්‍රස්ථාව ලබා දුන්නා මුතුහර ළමා සමාජයේ දු දරුවන් අතර අන්‍යෝන්‍ය සබඳතාවයක් තව තවත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් සහ ජාත්‍යන්තර එකමුතුව වැඩිකර ගැනීමේ පියවරක් හැටියට මෙය ක්‍රියාත්මක වෙන්නේ.

මෙය අධ්‍යාපනික සංචාරයක් ලෙසයි මූලිකවම සිදු වුනේ මෙයට සහභාගි වු රවිඳු සත්සර (අවු 17) සහ නයන සුදීප්ත (අවු 11) දරුවන් දෙදෙනාද සමග රූපවාහිනී අධ්‍යාපන අංශ ප්‍රධානී හා අධ්‍යක්ෂිකා එරින් විජේකෝන් මහත්මිය සහ ළමා වැඩසටහන් පිළිබඳ සහකාර අධ්‍යක්ෂක පද්මසිරි ප්‍රනාන්දු මහත්මා ඔවුන් සමග පැමිණියා.

2016 මාර්තු 14 වනදා ඔවුනගේ පැමිණීමේ සංචාරයේදී සිඩ්නි නුවර ඔපෙරා හවුස්, හාබර්බ්‍රිජ්, සෙන්ටර් පොයින්ට් ඇක්වේරියම් හා තවත් නොයෙකුත් ස්ථානවල වැදගත්කම හා අධ්‍යාපනික වටිනාකම වටහා ගැනීමට ඔවුනට හැකිවුනා.

මේ අතරට වනජීවි උද්‍යාන නරඹන්නටද ඕස්ට්‍රේලියාවට ආවේනික වු කැන්ගරු, කෝලා වැනි සත්ව කොට්ඨාශ නැරඹීමටද ලොව බෞද්ධ සිද්ධස්ථාන අතර ප්‍රචලිත නිව් සවුත් වේල්සයේ වොලොන්ගොන් නගරයේ බෞද්ධ ස්ථානය දැක බලා ගැනීමටත් සිඩ්නි නුවර ශ්‍රී ලාංකික බැතිමතුන්ට සෙවනක් වු ලංකාරාම විහාරය ද ඒ අතරට වුනා. අතිගරු පණ්ඩිත මීගහකුඹුරේ ධම්මගවේසී හිමිපාණන්ගේ ආශිරවාදයන්ද පිරිසට නොඅඩුව ලැබුනා.

ඉන් අනතුරුව ඔවුන් ඕස්ට්‍රේලියාවේ අගනගරය වු කැන්බරා, නුවර සංචාරයේ ද නියැලුනා.එහිදී ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව ඇතුළුව අනෙකුත් විශේෂ ස්ථාන පිළිබඳවද සංචාරය කර මනා දැනුමක් ලබා ගත්තා පමණක් නොව කැන්බරා නුවර ශ්‍රී ලාංකික මහ කොමසාරිස් කාර්‍යාලය මෙන්ම සිඩ්නි නුවර කොන්සල් ජනරාල් කාර්‍යාලය ද ඔවුනට අධ්‍යාපනමය දැනුමක් ලබාදීමට මහගු සහයෝගයක් ලබා දුන්නා.

කැන්බරා නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරින් වගේම සෝමසුන්දරම් ස්කන්ධ කුමාර ශ්‍රී ලංකා මහ කොමසාරිස් තුමාද, සිඩ්නි නුවර කොන්සල් ජනරල් තැන්පත් ලාල් වික්‍රමතුංග මහතා ඇතුළු නිලධාරයන්ගෙන් ලැබුනු පිළිගැනීම ඔවුනට මහත් වූ සතුටක්.
ඇබෝරිජිනල් වරුන්ගේ ඉතිහාසය.මතක සටහන් ඔවුන්ගේ ආදිවාසී තොරතුරු රැස් කරගන්නවා වගේම නිල් කඳුවැටියේ (Blue Mountain) ආශ්චර්ය විඳගැනීමේ වාසනාවද ලැබුනා.

මේ ගමනට තවත් යමක් එක්කරගන්නට සිඩ්නි නුවර . "මුතුහර" ළමා සාමාජයටද හැකිවුනා.නුදුරු දිනකදි නැවතත් ඔවුන් ගෙන්වා ඔවුන් සමග සිඩ්නි දරු දැරියන්ගේ "සංගීත සන්ධ්‍යාවක්" ඉදිරිපත් කරන්නට කටයුතු කරන්නට මෙවැනි දක්ෂතා ඇති දු දරුවන් ගෙන්වා මෙරට දු දරුවන්ගේ දක්ෂකම් තව තවත් මුවහත් කරගැන්මට දිරියක් වීම ගැන මෙහි ක්‍රියාකාරි "මුතුහර" නිලධාරි පිරිස සතුටු වෙනවා.
රවිඳු සත්සර හා නයන සුදීප්ත මේ ගමනේ ඇරයුමට සහභාගි කරවා ගනිමින් එරින් විජේකෝන් මහත්මියත් පද්මසිරි ප්‍රනාන්දු මහත්මා ගේ එකමුතුව තව තවත් "මුතුහර" ට වැඩදායක පියවරක් වුනා.

ඔවුන් විසින් මෙහෙයවනු ලැබූ කැමරාකරණය,වීඩියෝකරණය හා සංස්කරණය වීඩියෝ නිෂ්පාදන කටයුතු මේ වැඩමුළුවේදි දරුවන්ට මෙන්ම දෙමාපියනටද අගනා මෙහෙවරක් වුනා පමණක් නොව් ඒ දරු දෙදෙනා ද ඇතුළුව සිඩ්නි නුවර දරු දැරියන් එක්ව් කල ගායන ප්‍රසංගයන්ද ප්‍රසංසනීයයි.මෙවැනි ප්‍රසංගයක් කැන්බරා නුවර මෙන්ම සිඩ්නි අවට බිලැක්ටවුන් හා පැරමටා සිංහල පාසල් වලද සංගීතමය අංග වශයෙන් ඉදිරිපත් කලා.
ලක් බිමෙන් බැහැරව මුතුහර සරසන්නට උත්සාහ ගන්නා මෙරට දෙමාපිය පිරිස් වගේම සිඩ්නි නුවර මුතුහර සම්බන්ධීකරණයෙන් හැඩගන්වන සාමප්‍රිය සුමනසේකරයන් ගේ උත්සාහයත්, අනුශාසකත්වයෙන් හා උපරිම වූ දායකත්වය දෙන අධිනීතිඥ මහාචාර්ය මෛත්‍රී පනාගොඩ මහතා ගේ අතහිත දීමත් නිසා තව තවත් දිදුලනවා.

"මුතුහර" ළමා සාමාජය ජාත්‍යන්තර ශ්‍රී ලංකා ප්‍රජාව තුල ව්‍යාප්ත වීම මෙවැනි කටයුතු වලින් තව තවත් ගොඩනැගෙනවා වාගේම, එරට මෙරට දු දරුවන් අතර මනා අවබෝධයක් ගොඩනගා ගැනීම,ඔවුනොවුන් අතර සහෝදරත්වය, හැකියාවන් බෙදා හදා ගැනීමට දියුණුවන බව මේ සම්බන්දව කටයුතු කරන"මුතුහර" පිරිසේ ප්‍රර්ථනයයි.
එවන් ප්‍රර්ථනයක් මුදුන්පත් කරවා ගෙන "මුතුහර හරසර" ගෙනෙන්නට දිනෙන් දිනම ලැබේවායි ප්‍රර්ථනය කරමු.

කල්දෙමුල්ල
kaldemulla@gmail.com







රවිඳු සත්සර සහ නයන සුදීප්ත
සිඩ්නි නුවර කොන්සල් ජනරල් තැන්පත් ලාල් වික්‍රමතුංග මහතා සමග





රූපවාහිනී අධ්‍යාපන අංශ ප්‍රධානී හා අධ්‍යක්ෂිකා එරින් විජේකෝන් මහත්මිය සහ ළමා වැඩසටහන් පිළිබඳ සහකාර අධ්‍යක්ෂක පද්මසිරි ප්‍රනාන්දු මහත්මා